උපුල් ශාන්ත සන්නස්ගල
(සියලු ම හිමිකම් ඇවිරිණි)
*(All Rights Reserved)*



**01.** පහත දී ඇති ඡේද ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) මෙසේ මැණියන්ට චණ්ඩාල වාදයෙන් බිණූ අකුශලයෙන් එයින් මිය දෙවන ජාතියෙහි මහවැලි ගං අස මුණ්ඩවාක නම් ගම නැවැම් දුව ව ඉපද යට කියන ලද තිස්ස නම් නැවැමියා හා එක් ව බොහෝ කුසල් කොට එයින් චුත ව අනුරාධපුර සමීපයෙහි හෙල්ලෝලි නම් ගම නායක නැවැමියාට දූ ව උපන්හ. මේ සියලු ලක්දිව් තෙලෙහි ඔවුන් හා සමාන රූ ඇති අන් ස්ත්‍රියක් නැත. ඔවුන් වසන ගබඩාවෙහි පහන් ලුව මැනවැ යි නැත; හාත්පසින් සතර රියනෙක ශරීරාලෝක පැතිරෙයි; මුඛයෙන් මහනෙල් මල් සුවඳ පැතිරෙයි; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි; ඔවුන් අතින් අල්වන ලද කැඳ බත් ආදිය සාරමසක් පිලිහිනි නො වෙයි.......;

i. චණ්ඩාල වාදයෙන් බිණූ තැනැත්තිය කිනම් වී ද?
ii. මුණ්ඩවාක ගම නැවැමියා කිනම් වී ද? අනතුරු භාවයෙහි ඔහු කවරෙක් ද?
iii. **ගබඩාවෙහි, ශරීරයෙන්** යන පදවල ව්‍යාකරණ විභාග කරන්න.
iv. **'ඔවුන් වසන ගබඩාවෙහි පහන් ලුව මැනවැ යි නැත.'** යන්නෙහි අර්ථ දක්වන්න.

(ආ) එන සැටිය නපුරු වුවත් කප්ලක්ෂයක් පැරුම් පුරා ආ හෙයින් ඒ ලෙසින් යහපත් ව එන හිරිඔතප් සළු නො ලදින් උපන් වනිත් එන සිටුදුවණියන් පෘථග්ජන ලෙසින් තව බිළිඳි තැනැත්තවුන් දුටු සේක. උඉ වැළිත් පියුමතුරා නම් බුදුන් සමයෙහි ඒ බුදුන් එක් විනයධර මෙහෙණිණි කෙනෙකුන් උඩ ඔසවා නඳුනුයන සිටුවන්නා සේ විනයධර මෙහෙණින්නන්ට අගතැන් තබන්නා දැක 'මමත් මුඹ වහන්සේ වැනි බුදු කෙනෙකුන් වහන්සේ සමයෙක මේ තනතුරු ලැබෙම්ව' යි පැතූ ය. පියුමතුරා බුදුහුත් එන දවස බලා පැතීම සමෘද්ධ වන නියාව දැන 'මතු එන දවස ගොයුම් බුදුන් සමයෙහි විනයධර මෙහෙණින්නන්ට අග්‍ර ව පටාචාරා ස්ථවිරී ය යි ප්‍රසිද්ධ වව' යි වදාළ සේක.

i. **ලැබෙම්වා** යන පදයෙහි ව්‍යාකරණ විභාග කරන්න.
ii. මෙහි එන උපමාවක් හා රූපකයක් දක්වන්න.
iii. ඇය කළ ප්‍රාර්ථනාව කුමක් ද?
iv. **පියුමතුරා, හිරිඔතප්, ගොයුම්, නඳුනුයන** යන පදවල අර්ථ දක්වන්න.

(ඇ) මෙසේ බමුණු කී බස් අසා මඬුවා කියනුයේ 'මේ බමුණු ඉතා ම පක්ෂග්‍රාහී එකෙක. සියලු රාජ්‍යය අළලා බොහෝ වධ - බන්ධනාදියෙන් සත්ත්වයන් පෙළන, ඡන්දයෙන් අගතියට ගොස් ප්‍රජා පාලනය නො කොට හිඳිනා මේ රජ හට මා කීයේ වැරැද්ද ය යි කියයි. ඉදින් බමුණ, මේ රජ දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්නේ වී නම් මේ රාජ්‍යය වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘද්ධ වන්නේ ය; කලට වැසිත් වැස සමෘද්ධ ව ශස්‍යයෙන් යුක්ත වන්නේ ය. සියලු වැව් පොකුණු හෝ කඳුරැළි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය. සත්ත්වයෝත් සුඛිත මුදිත වූවාහු බත් අනුභව කරන කල්හි අග්‍රපිණ්ඩය ඇර කපුටුවන්ට දෙන්නාහ. කපුටුවෝ බත් අනුභව කොට මෙලෙස ප්‍රාණවධ නො කරන්නාහ යි යනාදීන් රජ්ජුරුවන්ගේ අමැදහත්කමින් මේ සියල්ල වන්නේ ය'

i. **දශරාජධර්මයෙන්** යන පදයෙහි ව්‍යාකරණ විභාග කරන්න.
ii. ඡන්දයෙන් අගතිගාමී වීමෙන් සිදු වී ඇත්තේ කුමක් ද?
iii. ප්‍රණීත ජලයෙන් පිරෙන්නේ මොනවා ද?
iv. **ඡන්දයෙන්, ශස්‍යයෙන්, කඳුරැළි, අග්‍රපිණ්ඩය** යන පදවල අර්ථ දක්වන්න.

**02.** පහත දී ඇති පද්‍ය ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ)
රැපුන් ඔද සින්දූ
දිය දද දිගත රැන්දූ
රදු නමින් බැන්දූ
කියති සමහරු නොයෙක් සින්දූ

නරනිඳු හට සොඳුරු
බඳ යස සොලෝ විසිතුරු
දන පදරුත් මියුරු
කියා වනපොත් කෙරෙති සමහරු

සමහරු උන් බසින්
පිබිද ඉඳගෙන සතොසින්
පවසති සැඬ ගොසින්
නිරිඳු විරුදාවලී නෙ ලෙසින්

පෙර ලක්දිව නො මඳ
රජ කළ රජුන්ගේ සොඳ
ගුණෙන් බඳ සිවුපද
කියති සමහර මහල්ලෝ ඉඳ

i. එඩිය බිඳ දමුවේ කවරෙකුගේ ද?
ii. වනපොත් කරන්නේ කුමක් ද?
iii. මහ හඬින් පවසන්නේ කුමක් ද?
iv. **මහල්ලෝ, පදරුත්, විරුදාවලී, දිගත** යන පද විසන්ධි කර දක්වන්න.

(ආ)

| | | | |
|---|---|---|---|
| අඹ දලු තඹ පබා සිඳ නො | තබා යා | ඉඳුනිල් කොළ'තුරා | එපැහැ'යුරා යා |
| ගෙන තම පිය අඹා තුඬග | තබා යා | විලිකුන් අඹ'වුරා | තුඬ'ගිනිරා යා |
| සිඹසිඹ රති ලොබා දෙපිය | ගබා යා | එන රස උරඋරා ලොබ නො | හැරා යා |
| උන් පරපුටු සුබා සකි | නරඹා යා | නරඹ නඳන ගිරා පෙළ | ඉඳුරා යා |

i. කෝකිලාවගේ තුඬග තබන්නේ කුමක් ද?
ii. කොවුල්කෙවිලියන් කෙසේ සිටින බවක් පැවසේ ද?
iii. ගිරවුන් ගැන කවියා පවසන්නේ කුමක් ද?
iv. **දෙපිය ගබායා, ඉඳුරායා, විලිකුන්** යන පදවල අර්ථ දක්වන්න.

03. පහත සඳහන් උද්ධෘතයන් සඳහා **අවස්ථා සම්බන්ධය** ලියන්න.

i. 'මේ බාල මෙහෙණී තොම පෙර එක් ජන්මයෙක්හි මට කළ තදකමක් සිතා හඬන්නී'
ii. 'ස්ත්‍රීන් කෙරෙහි වල්ලභයන්ට හිතපක්ෂ කෙනෙක් දුර්ලභ ය. වල්ලභයන්ගෙන් ස්ත්‍රීන් කෙරෙහි හිත පක්ෂ කෙනෙකුන් ලද නො හැක්ක'
iii. 'නො ලද හොත් මෙතරම් තරයක් ඇති තැනැත්තෝ නො යෙති'
iv. 'එසේ හෙයින් හිරු රැසින් ප්‍රබුද්ධ වන්නා වූ පියුම් වනය චන්ද්‍රාලෝකය දැක කෙසේ නම් ප්‍රබෝධශ්‍රීයට පැමිණේ ද?'

04. මෙම ප්‍රශ්නයෙහි සියලු ම අනුකොටස්වල **නිවැරදි** වරණය තෝරන්න.

1. **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය** තෝරන්න.
   i. රජ සිය මිත්‍රයා ඇමතියෙක් කළේ ය.
   ii. රැස්වීමට ගායකයෙක් පැමිණිය හොත් සෙනඟ ද ඒකරාශී වනු ඇත.
   iii. වීරයෙක් වූ සෙබළා රට වෙනුවෙන් දිවි පිදී ය.
   iv. පින්නවල අලි අනාථාගාරයෙහි ඇත්තු ද ඇත.
   v. දෙමාපියෝ කියන දෑ සත්‍ය නො වේ.
2. **වර්ගාන්තාක්ෂරයක් යෙදී නො මැති** වරණය තෝරන්න.
   i. ක, ඛ, ග, ඝ, ඞ ii. ච, ඡ, ජ, ඣ, ඤ iii. ට, ඨ, ඩ, ඪ, ඬ
   iv. ත, ථ, ද, න, ඳ v. ප, ව, බ, ම, හ
3. **අක්ෂර වින්‍යාසය නිවැරදි** වරණය තෝරන්න.
   i. කෙකිනී, කෙණෙර, කෙණ්ඩය, කෙනහිලි, කෙළවර
   ii. කෝණමානය, කෝසිකාව, ක්‍රීඩාංගනය, ක්‍රමානුකූල, බණිජ
   iii. ඛේදජනක, ගනක, ගණුදෙණු, ගලනවා, ගැමුණු
   iv. ගුරුමුෂ්ඨි, ගෙපල, ගොලුමුහුද, ගෝනිය, ගෝණා
   v. ඝණීභවනය, චන්ද්‍රපානි, චූර්නිකා, ඡවි, තීක්ෂණ
4. සිඟමන් **යදිමින්** ගිය යාචකයා දැත් **එක් කොට** හිස **නමද්දී** අසල සිටි මඟියෙක් **මේක ගන්න** යැයි කියමින් රුපියල් දහයක් දිගු කළේ ය.

   ඉහත වාක්‍යයෙන් අංකිත පද අයත් ක්‍රියා නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
   i. විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්වක්‍රියා
   ii. පූර්වක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
   iii. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්වක්‍රියා
   iv. මිශ්‍ර ක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
   v. මිශ්‍ර ක්‍රියා, පූර්වක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
5. **නිපාත පදයක් ඇතුළත් ව නො මැති** වරණය තෝරන්න.
   i. මෙන් ii. සා iii. නිරතුරු iv. සදොස් v. විතර
6. **නිවැරදි ව පද බෙදා ඇති** වරණය තෝරන්න.
   i. අපේ රටේ මුහුදු තීරය රටටම සම්පත කි.
   ii. විහඟ ගී නාදය සමඟ උදා හිරු දසතින් කිරණ විහිදුව යි.

iii. මිනිස් සන්තාන ගත සිතු විලි යහපත් වුව හොත් සොඳුරු සමාජයක් බිහිවෙයි.
iv. ජපානයට සුනාමි උවදුර මහත් විනාශයක් කළේ ය.
v. අලංකාර ගී නැටුමින් යුත් පෙරහැරක්වීදී සංචාරය කරන බව ප්‍රචාරය කෙරුණි.

7. මළගෙදරට පැමිණි කුලීකරුවෝ දෙනෙතට **ළුණු** පොඩි කරගෙන කිඹුල් කඳුළු වැගිරූහ.
අංකිත අක්ෂරවල දැක්වෙන පිල්ලම් නිවැරදි ව නම් කර ඇති වරණය තෝරන්න.
i. පාපිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල. ii. දීර්ඝ පාපිල්ල, පාපිල්ල, ඉස්පිල්ල.
iii. දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ පාපිල්ල. iv. දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදය.
v. දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇදය, දීර්ඝ ඉස්පිල්ල.

8. **"කියන ලදහ"** යන්න
i. කර්තෘකාරක, බහුවචන, උත්තම පුරුෂ, අතීත කාල ආඛ්‍යාතයකි
ii. කර්මකාරක, බහුවචන, උත්තම පුරුෂ, අතීත කාල ආඛ්‍යාතයකි
iii. කර්මකාරක, ඒකවචන, මධ්‍යම පුරුෂ, අතීත කාල ආඛ්‍යාතයකි
iv. කර්මකාරක, බහුවචන, ප්‍රථම පුරුෂ, අතීත කාල ආඛ්‍යාතයකි
v. කර්තෘකාරක, බහුවචන, ප්‍රථම පුරුෂ, අතීත කාල ආඛ්‍යාතයකි

9. එතුමන් **ප්‍රභාතයේ දී ඉසුඹු ලන** මොහොතක විඳි **ආහ්ලාදය** අපමණ ය.
ඉහත වාක්‍යයේ අංකිත පදවල සමානාර්ථය සහිත වරණ තොරන්න.
i. මැදියමේ දී, කල්පනා කරන, සාංකාව ii. අරුණෝදයේ දී, විවේක ගන්නා, සතුට
iii. අරුණෝදයේ දී, සුසුම් හෙළන, වේදනාව iv. සැඳෑවේ දී, සුසුම් හෙළන, වේදනාව
v. රාත්‍රියේ දී, ඇවිද යන, බිය

10. **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය** සහිත වරණය තෝරන්න.
i. ශ්‍රී ලාංකිකයෝ ප්‍රෞඪ සංස්කෘතික උරුමකරුවන් වෙති.
ii. පන්සලේ නායක හාමුදුරුවන් බණ මඩුවට වඩිති.
iii. අනාගත නායකයන් ප්‍රාඥයන් වෙත්වා!
iv. විශාඛාවෝ සන්සුන් ව ගමන් කරයි.
v. දරුවන් ද සමඟ මව පන්සලට යයි.

11. **නිවැරදි ප්‍රකාශය** සහිත වරණය තෝරන්න.
i. 'සමාස' යන්න පද කෙටි කරන ව්‍යාකරණ සිද්ධාන්තයක් නො වේ.
ii. ර - යන්නට රේඵය නො යෙදේ.
iii. ර - යන්නට යංශය යෙදේ.
iv. තද්භව යනු එම භාෂාවේ ම නිර්මාණය වූ පද යි.
v. සිංහල භාෂාවේ නිපාත 42කි.

12. **ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන** වචන ඇතුළත් වරණය තෝරන්න.
i. නාගරික, නෛතික, සිඟිති, ගුණවත් ii. මෙන්, සේ, වැනි, සුදන
iii. බුදුබණ, රාජඅණ, සොරබිය, විදුලිබිල iv. අවගුණ, ප්‍රවර, පරසිරිත්, දුර්ජන
v. සිඟමන්, ගෙරවිලි, නැටුම්, රඟනු

13. **විරුද්ධාර්ථයක් සහිත පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
i. සුලබ - විරල, ආදීනව - ආනිසංස ii. ඍජු - වක්‍ර, ප්‍රාචීන - ප්‍රතිචීන
iii. ප්‍රසාද - අප්‍රසාද, පැහැ - අවපැහැ iv. අතිථි - ආගන්තුක, අංජන - ශ්වේත
v. පුරපස - අවපස, උත්තීර්ණ, අවතීර්ණ

14. **පූර්වරූප සන්ධියක් යෙදී නැති** වරණය තෝරන්න.
i. විස්සම්
ii. වත්තම්
iii. පෙස්සම
iv. සන්නස්
v. කම්මල

15. **බහුවචන උක්ත පදයක් සහිත** වරණය තෝරන්න.

i. තෙමේ  ii. තුමූ  iii. තොමෝ  iv. ඔවුන්  v. මිනිසුන්

16. **අරඹති** යන ක්‍රියාවෙහි අතීත කාල, කර්මකාරක, ප්‍රථම පුරුෂ, ඒකවචන රූපය සහිත වරණය තෝරන්න.

i. අරඹන ලදි  ii. ඇරඹුවේ ය  iii. අරඹති  iv. අරඹන ලදහ  v. අරඹනු ලැබූ හ

17. **සමාස පදයක් නො මැති** වරණය තෝරන්න.

i. ඉරහඳ  ii. බුදුගුණ
iii. තිනෙත්  iv. මුදල්හදල්
v. මුතුදසන්

18. **තමා වැරදි කරමින් අනුන්ට උපදෙස් දීම** යන්නට සුදුසු පිරුළු වැකිය සහිත වරණය තෝරන්න.

i. වැදි බණ වගේ  ii. ගමරාල දිව්‍යලෝකේ ගියා වගේ
iii. ගමරාල සිල් ගත්තා වගේ  iv. අඟේ ඉඳන් කන කනවා වගේ
v. ඉබ්බෙක් අහසෙන් ගියා වගේ

19. **අනුරූප සංයෝගය නිවැරදි** වරණය තෝරන්න.

i. දහම් චක්‍රය  ii. දළදා මන්දිරය  iii. චන්ද්‍ර මඬල
iv. හිරුරැස්  v. පාඨශාලා බිම

20. **ප්‍රත්‍යාර්ථ නාමයක් නො මැති** වරණය තෝරන්න.

i. සාහිත්‍යය  ii. නටන්නා  iii. ඓතිහාසික
iv. සුදන  v. නැටිලි

05.

(අ) **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

i. මා විසින් ඔහු වංචා කරනු ලැබුවෙමි.
ii. සම්ප්‍රදාය වෙනස් කරන්නෝ එය අවබෝධයෙන් කළ යුතු ය.
iii. අකුසලය කළ තැනැත්තා පසුපස ලුහු බඳිනු ලබයි.
iv. අනාගත පාලකයෝ සත්පුරුෂයෝ වේවා!
v. විචාරකයන් බොහෝ දෙනෙකු ලේඛකයන් නො වේ.

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

i. හොඳින් ඉගෙන ගන්නා දරුවෝ දෙමාපියන් සතුටු කරති.
ii. ප්‍රාථමික අංශයේ සිසුහු ළමා වෙළඳපොළක් පැවැත්වූ හ.
iii. ළමයි සියල්ලෝ ම පන්තිය පිරිසිදු කරති.
iv. සාමකථා ගැන විචාරකයා අදහස් පළ කළේ ය.
v. රජතුමා දැහැමින් සෙමෙන් රට පාලනය කරයි.

(ඇ) නිවැරදි වාක්‍ය නිර්මාණය සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

i. අද දින (මව්පියෝ / මව්පියන්) පාසලට එති' යි (මම / මා) සිතුවෙමි.
ii. අල්ලස් දූෂණ නඩුවේ (විත්තිකරුවෝ / විත්තිකරුවන්) නිදහස් (වෙති / වෙයි).
iii. අතිපූජ්‍ය මහ නා (හිමි / හිමියෝ) අසරණ ජනතාවට පිහිට (වූ හ / විය).
iv. දෙපිරිස අතර ඇති වූ ගැටුම සමථයකට පත් කිරීමට (මම / මා) (වෙහෙසුණි / වෙහෙසුණෙමි).
v. මුනිදාස (කුමාරතුංගයන් / කුමාරතුංගයෝ) හෙළබසට මිණි පහනක් (වූ හ / විය).